**ශීර්ෂය - 428 මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි මස 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි මස 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යායුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩසටහන 01 හි වැය විෂයයන් 02 ක හා වැඩසටහන 02 හි වැය විෂයයන් 03 ක වර්ෂය අවසානයට පැවති වැය ලෙජර ශේෂය රු.8,681,984 ක් වූ අතර ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ ශේෂය රු.9,002,658 ක් වූ බැවින් රු.320,674 ක වෙනසක් විගණනයට නිරීක්ෂණය විය. | වැය ලෙජරයේ අගයන් එකතු කිරීමේදී සිදුවී ඇති අත්වැරදීම් නිසා මෙම වෙනස්කම් ලැබී ඇත. | නිවැරදිව අගයන් ගිණුම් වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමකින් තොරව 2020 සහ 2021 වර්ෂවල ස්ථාවර වත්කම් මිලදී ගැනීම, කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම හා කාර්යාල නවීකරණ කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් සිදුකරගෙන තිබුණි. ඒ සඳහා වැයවූ රු.25,094,035 ක මුදල රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූරණ කරගැනීමේ පදනම යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ලබාදී තිබුණු අතර මෙම ගණුදෙනුව රාජ්‍ය අමාත්‍යාංශයේ ගිණුම්වල දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ මහවැලි කලාප ආශ්‍රිත ඇලවෙලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අලුතින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් කිසිවක් නොතිබූ හෙයින් හදිසි මිලදී ගැනීම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදුකර ගෙන ඇත. 2021 සඳහා අයවැය ඇස්තමේන්තු යටතේ මෙම මුදල් ඉල්ලීම් කර ඇති අතර රජය මගින් ප්‍රාග්ධන වියදම් සීමා කිරීම තුළ එම ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැත. ගෙවීම් කර නොමැති හෙයින් මෙම තොග ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව | වාර්ෂික ඇස්තමේන්තුව මගින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදු නොකළ යුතු අතර අදාළ බැරකම් ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

පවතින අතර මහ භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන මත මුදල් ගෙවා අමාත්‍යාංශ පොත්වලට ඇතුළත් කරනු ලැබේ. ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති හෙයින් බැරකම් ලෙස බැඳීම් බැරකම් ලේඛනයෙහි සටහන් කිරීමට නොහැකි බව දන්වමි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු. 1,250,000,000 ක් වුවත් වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය වෙත යවන ලද ඉන්වොයිස්පත්වල වටිනාකම රු.1,504,328,099 කි. ආදායම් රැස් කිරීම සම්බන්ධව නිවැරදිව අධීක්ෂණ කටයුතු සිදුකලේ නම් මු.රෙ.85(2)(ආ) ප්‍රකාරව සංශෝධිත ඇස්තමේන්තුවක් පිළියෙල කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කළයුතු වුවද, රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. | කාලගුණික විපර්යාස අනුව පවතින වර්ෂාපතන තත්ත්වය මත ජල මට්ටම තීරණය වන අතර ඒ අනුව නිපදවිය හැකි ජල විදුලි ප්‍රමාණය ද වෙනස්වේ. 2021 වර්ෂයේ ඔක්තෝබර් හා නොවැම්බර් මාසයන්වල අධික වැසි ලැබීමත් සමග නිපදවන ලද ජල විදුලි ප්‍රමාණය ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා වැඩිවන ලදී. එම නිසා ඇස්තමේන්තුගත ආදායමේ වැඩිවීමක් සිදුවී ඇත. ඉදිරියේ දී මෙසේ ඇස්තමේන්තුගත ආදායමේ සිදුවන උච්චාවචනයන් සලකා බලා ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 20.03.08.00 දරන ආදායම් සංකේතාංකයට අදාළව 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු.1,250,000,000 ක් වන අතර සමාලෝචිත වර්ෂය තුළ රැස් කළ ආදායම රු.538,063,129 ක් විය. ඉන් රු.243,731,417 ක් 2021 වර්ෂයට අදාළ වන අතර ඉතිරි මුදල රු.294,331,712 පසුගිය වර්ෂයට අදාළ හිඟ මුදල වේ. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ ආදායමින් සියයට 19.5 වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | වර්ෂයට අදාළව ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු මුදල් සඳහා ඉන්වොයිස් පත් නිකුත් කළද එම ලැබිය යුතු මුදලින් කොටසක් පමණක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවීම් කර ඉතිරි මුදල ඊලග වර්ෂයේ දි ගෙවීම් කිරිම පසුගිය කාලය පුරාවට සිදු කර ඇත. ඒ අනුව 2021 වර්ෂයට අදාළ ආදායමින් රු.243,731,417 ක මුදලක් 2021 වර්ෂයේ ද රු.4,255,148 ක මුදලක් 2022 වර්ෂයේ ද ගෙවීම් | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලය තුළ පවතින මූල්‍ය දුෂ්කරතාවය හේතුවෙන් මෙම ගෙවීම් ප්‍රමාදවී ඇත. | |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩසටහන 01 යටතේ වැය විෂයයන් 02 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.1,900,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබූ අතර, වැය විෂයයන් 07 ක සියයට 28 සිට 97 දක්වා වූ පරාසයක ඉතිරියක් හා වැඩසටහන 02 යටතේ වැය විෂයයන් 06 ක සියයට 31 සිට 84 දක්වා වූ පරාසයක ඉතිරියක් නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය, වර්ෂය තුළ වැඩි දියුණු කිරීම් කිසිවක් සිදු නොකිරීම, අනුමත කාර්ය මණ්ඩලය නොසිටීම හා ගෙවීමට බිල්පත් නොතිබීම මෙම ඉතිරිවීම්වලට හේතුවී ඇත. | ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

### 2.2.1 මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩසටහන 01 යටතේ එක් වැය විෂයයක් සඳහා වෙන්කර තිබූ රු.300,000 ක් හා වැඩසටහන 02 යටතේ එක් වැය විෂයයක් සඳහා වෙන්කර තිබූ රු.400,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබූ අතර, වැඩසටහන 01 යටතේ වූ එක් වැය විෂයයක සියයට 65 ක ඉතිරියක් සහ වැඩසටහන 02 යටතේ වැය විෂයයන් 03 ක සියයට 26 සිට සියයට 80 දක්වා වූ පරාසයක ඉතිරියක් පැවති බව නිරීක්ෂණය විය. | වර්ෂය තුළ වැඩිදියුණු කිරීම් කිසිවක් සිදු කිරීමට අවශ්‍ය නොවීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු කිරීම් හා රාජකාරි සීමාවීම, අක් මුදල් නොලැබීම හා බිල්පත් නොලැබීම සහ පියවීමට බිල්පත් නොතිබීම ඉතිරියට හේතුවී ඇත. | ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

**2.3** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි (සටහන iii) වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 6 කට අදාළව බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් ඇති බැරකමෙහි වටිනාකම රු.5,598,447 ක් වුවත්, එම අගය රු.48,247,702 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. එසේම එයට අදාළ බැරකම් නිදහස් කිරීම රු.286,169 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා තිබුණද, එහි නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය. | 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙන් (සටහන iii) වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 6 ට අදාළව වෙන් වෙන්ව දක්වා ඇති බිල්පත්වල වටිනාකම් නිවැරදි වන අතර ඒවායේ එකතුව ලබා ගැනීමේදී සිදුවී ඇති අත්වැරදීමක් නිසා බැරකම් වටිනාකම රු.48,533,871 ක් ලෙසත් ගෙවූ මුදල රු.286,169 ක් ලෙසත් ශේෂය රු.48,247,702 ක් ලෙසත් සඳහන්වී ඇත. එම අගයන් බැරකම් වටිනාකම රු.5,598,447 ලෙසත් ගෙවූ වටිනාකම් ශේෂයක් නොමැති ලෙසත් නිවැරදි විය යුතු බව පිළිගනිමු. | නිවැරදිව සංඛ්‍යා ගිණුම්වල වාර්තා කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව 2021 වර්ෂය සඳහා මුළු බැරකම් වටිනාකම රු.339,980,921 ලෙසද, බැරකම් නිදහස් කිරීම් රු. 256,864,175 ක් ලෙසද දක්වා තිබුණද ගණනය කිරීම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේදී මුළු බැරකම් වටිනාකම රු.345,579,368 ක් බවත්, බැරකම් නිදහස් කිරීම රු.264,883 ක් බවත් හා බැරකම් ශේෂය රු.345,314,485 ක් බවත් විගණනයට නිරීක්ෂණය විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනයේ සටහන (iii) යටතේ වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවලට අදාළව දක්වා ඇති බැරකම් වටිනාකම් සනාථ කරගැනීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු බැවින්, එම අගයන්හි නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට විගණනයට නොහැකි විය. | 2021 වර්ෂය සඳහා මුළු බැරකම් වටිනාකම අත්වැරදීමකින් එකතුව ලබා ගැනීමේදී සටහන්වී නොමැති අතර මුළු බැරකම් වටිනාකම රු.345,579,368 ක් ලෙසද ගෙවූ බැරකම් රු.264,702 ලෙසද බැරකම් ශේෂය රු.345,314,666 ක් ලෙසද නිවැරදි විය යුතුය.<br>මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) හි එක් එක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවලට අදාළ බැරකම් වටිනාකම් සාරාංශ කර මූල්‍ය ප්‍රකාශය තුළ දක්වා ඇති අතර බැරකම් ලේඛනය අවසානයේ " * 428-2-3-8-2506 යටතේ ඇති බැරකම් සඳහා ඇමුණුමක් මේ සමග ඉදිරිපත් කර ඇත. (සටහන iii) " ලෙස සටහනක් යොදා ඇති අතර ඊට අදාළ විස්තරාත්මක බැරකම් ලේඛනය මූල්‍ය ප්‍රකාශන සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) 2021 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ විදුලිය හා ජල බිල්පත් වටිනාකම රු.582,892 ක් ගෙවීම් කර නොතිබුණු අතර, 2021 මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් බැරකම් ප්‍රකාශනයෙහිද ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. | අමාත්‍යාංශයට අදාළ ජල හා විදුලි බිල්පත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි. 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාළ බිල්පත් පිළිබඳ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර ලැබී නොතිබීම හේතුවෙන් ගිණුම්වල දක්වා නැත. | අවශ්‍ය තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශ සමඟ බැරකම් අනාවරණය කළයුතු වේ. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **----------------------** | **-----------------------------------** | **-------------** |
| (අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවියයුතු වුවත්, අවස්ථා 26 කදී දින 18 සිට දින 298 දක්වා වූ කාලපරාසයක අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය. | සුළු වාහන අලුත්වැඩියා වියදම්, ඉන්ධන අත්තිකාරම් හා සංග්‍රහ වියදම් සඳහා වර්ෂය ආරම්භයේදි අත්තිකාරම් ලබාගෙන මාසිකව ප්‍රතිපූර්ණය කිරීම පදනම මත කටයුතු කර ඇත.අනිකුත් ඉන්ධන අත්තිකාරම් වාහන අනුයුක්ත කර ඇති නිලධාරින් විසින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා ක්ෂේත්‍රයට යාමේදී අතිරේක ඉන්ධන අත්තිකාරම් ලෙස ලබා දී ඇති අතර, පියවීම අදාළ නිලධාරින් විසින් සිදු කර ඇත. තවද මෙම අත්තිකාරම් මුදල් අදාළ වියදම දැරීමෙන් පසුව කඩිනමින්ම පියවීම සඳහා කටයුතු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කිරීමට සටහන් කර ගතිමි. | කාර්යය නිමවූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාර අතුරු අග්‍රිම ලබාදීම මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සිදුකළයුතු වුවද, අවස්ථා 08 කදී මාණ්ඩලික නොවන නිලධාරීන්ට අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | මෙම අමාත්‍යාංශය යටතේ ප්‍රමාණවත් මාණ්ඩලික නිලධාරින් ප්‍රමාණයක් නොසිටි බැවින් අත්තිකාරම් ලබා දීම අමාත්‍යාංශ ප්‍රධානියාගේ අනුමැතිය ලබා ගෙන කාර්ය මණ්ඩලයේ සිටි අදාළ නිලධාරින් වෙත එම අත්තිකාරම් ලබා දීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධති අංශ අතර ක්‍රියාත්මක කර ඇති අතර, අභ්‍යන්තර විගණන අංශයක් දැනට ස්ථාපිතව නොමැති හෙයින් මෙය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට නොහැකිවී ඇත. ඉදිරියේදී අභ්‍යන්තර පාලන පද්ධතිය සවිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු වූවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක අවශ්‍යතාවය අවධාරණය කර ඇති අතර ඒ පිළිබඳව වරින් වර රාජ්‍ය සේවා පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. 2022 වර්ෂය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහාය හා මග පෙන්වීම ලබා දෙන ලෙස ලිඛිතව ඉල්ලා ඇත. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.6 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104 (1) (අ)104 (3) හා 104 (4) | 2021 අප්‍රේල් 25 දින සිදුවූ වාහන අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කළයුතු කටයුතු නියමිත කාලරාමුව තුළ සිදුකර නොතිබුණි. | වාහනයේ රිය අනතුර සිදුවූ දින වන විට රට තුළ පැවති වසංගත රෝග තත්ත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පනවා කාර්යාලයට නිලධාරින්ගේ පැමිණීම සීමා කර තිබූ බැවින් අනතුරට අදාළව මු. රෙ 104(1)(අ) යටතේ පරීක්ෂණ මණ්ඩලය පත්කිරීම ප්‍රමාදවී ඇති බව, ඒ අනුව මු.රෙ 104(3) හා (4) ප්‍රකාරව අදාළ වාර්තාද නිසි කාල රාමුව තුල සම්පූර්ණ කිරීමට නොහැකි වූ බව සහ ඉදිරියේදි අදාළ නිවැරදි කිරීම් සහිතව කටයුතු කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 109 (1) (අ) | අලාභහානි පොතෙන් අස්කිරීමේ සෑම නියෝගයකම පිටපතක් විගණකාධිපතිට යැවිය යුතු වූවද, අනතුරට අදාළව රක්ෂණාවරණයෙන් ආවරණය කරගත නොහැකිවූ රු. 34,429 ට අදාළ පොතෙන් අස්කිරීමේ නියෝගයේ පිටපතක් 2022 අප්‍රේල් 25 දින වනවිටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ 109(1)(ආ) ප්‍රකාරව අලාභය පොතෙන් අස් කිරීම සඳහා අදාළ ලේඛන විගණකාධිපතිට පිටපත් සහිතව අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත 2022.03.29 වන දින යොමු කර ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 128(2) (ඇ) | ආදායම් ගණන්දීමේ නිලධාරීන් හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා අදාළ කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන මාසය ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් සම්බන්ධ අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත එවා නොමැති බව පිළිගන්නා අතර ඉදිරියේදී නිසි පරිදි එවීමට කටයුතු කරන්නෙමු. | -එම- |
| (iv) | මුදල් රෙගුලාසි 135 | ආදායම් ගිණුම් සම්බන්ධයෙන් ආදායම් තක්සේරු කිරීම, එකතු කිරිම හා ප්‍රතිග්‍රහණය කිරීම පිළිබඳ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශ ලේකම් 2021.04.27 දින සිට ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් පත් කර ඇත. මූල්‍ය බලතල පැවරීමක් 2021 තුළ සිදුවී නොමැති බව පිළිගන්නා අතර ඉදිරි වර්ෂය සඳහා බලතල පැවරීමෙන් නිවැරදි කරන බව දන්වමි. | -එම- |
| (v) | මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු දැනටමත් ආරම්භ කොට ඇති අතර හැකි ඉක්මනින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම-. |
| (vi) | මුදල් රෙගුලාසි 1642 | වාහන පාවිච්චි කරන නිලධාරීන් විසින් හෝ එම වාහනවල රියදුරන් විසින් හෝ සිදුවන සියළුම හදිසි අනතුරු ලඟම ඇති පොලීසියට වාර්තා කළයුතු වුවත්, වාහන අනතුර පිළිබඳව පොලීසියට වාර්තා කර නොතිබුණි. | මේ පිළිබඳව රියදුරු මහතුන් ලිඛිතව දැනුවත් කර ඇති අතර, ඉදිරියේදී මෙවැනි කටයුතු සිදු නොවීමට සියළුම රියදුරන් නැවත දැනුවත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | -එම-. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2015 ජූනි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය | | | |
| (i) 4 ඡේදයේ (අ) වගන්තිය | අයවීමට ඇති ආදායම් ප්‍රමාණය, එකතු කරන ලද ආදායම් ප්‍රමාණය සහ හිඟ ආදායම් කිසිවක් වේ නම් එම ප්‍රමාණයද පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා ගතයුතු වුවද, අමාත්‍යාංශය විසින් ආදායම් සංකේතාංකයට අදාළව වාර්තා පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස පත්කර ඇත්තේ 2021.04.07 වන දින බැවින් මේ සම්බන්ධව නිසි පරිදි ක්‍රියා කිරීමට නොහැකිවී ඇති බව පිළිගන්නා අතර ඉදිරියේ දී නිවැරදි වාර්තා පවත්වා ගැනීමට කටයුතු කරන්නෙමු. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) 4 ඡේදයේ (ආ) වගන්තිය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තවතවත් එකතුවීම වැලැක්වීම සඳහා ක්ෂණික පියවර ගැනීම ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් සිදු කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම අතපසුවීම් සිදුවී ඇති බව පිළිගන්නා අතර ඒවා නැවත සිදු නොවීමට වග බලා ගනිමු. | -එම-. |
| (iii) 7 ඡේදය | සියලුම ආදායම් ගණන්දීමේ නිලධාරින් විසින් තම අර්ධ වාර්ෂික ආදායම් වාර්තා නියමිත කාල සීමාව අවසන් වූ දින සිට දින 15ක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වුවද, රාජ්‍ය අමාත්‍යාංශය 2021 වර්ෂය සඳහා අර්ධ වාර්ෂික ආදායම් වාර්තා පිළියෙල කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) 2022 ජනවාරි 12 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමේ පදනම සංශෝධනය කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ මාර්ගෝපදේශ අනුව අදාළ ආකෘති පත්‍ර භාවිතා කළ අතර සංසන්දනාත්මක තොරතුරු 2020 නැවත ගලපන ලද තොරතුරු තීරුවේ දක්වා ඇත. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 21 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගතයුතු වුවද, රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කර තිබුණේ 2021 නොවැම්බර් 15 වනදින දීය. | කොවිඩ් වසංගත තත්ත්වය මත මහවැලි රාජ්‍ය අමාත්‍යාංශයට අයත් 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2021.03.15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගෙන ඇත. එමෙන්ම, 2021 වර්ෂයේ දිගින් දිගටම පැවති වසංගත තත්ත්වය හා මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයට ලක් කරන ලද අතර එම සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2021.11.15 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත යොමු කර අදාළ අනුමැතිය ලබා ගන්නා ලදී. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ට අදාළව රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 හි 8 ට අනුව තවදුරටත් වාර්තා කළයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම්ගත කළයුතු බව දක්වා තිබුණද 2020 දෙසැම්බර් 18 දින හා 2020 දෙසැම්බර් 22 දින වාරිමාර්ග අමාත්‍යාංශයෙන් ලද වාහන 5 ක් ගිණුම්ගත කිරීමට 2022 අප්‍රේල් වන විටත් කටයුතු කර නොතිබුණි. | 2020.12.22 වන දින වන විට අමාත්‍යාංශය ප්‍රතිස්ථාපනයවී තිබීම හේතුවෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ තිබූ වාහන වාරිමාර්ග අමාත්‍යාංශය භාරයට ගෙන තිබූ අතර, එසේ වාරිමාර්ග අමාත්‍යාංශය භාරයට පත්වී තිබූ මෙම අමාත්‍යාංශයට අයත් වාහන 9 ක් නැවත මහවැලි රාජ්‍ය අමාත්‍යාංශය වෙතම භාර දී තිබුණි. එසේ භාර දී ඇත්තේ මෙම අමාත්‍යාංශය වෙත ලියාපදිංචි අයිතිකාරිත්වය අයත් වාහන බැවින් නැවත පවරා ගැනීමක් සිදුකර නැති බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාර අමාත්‍යාංශයක ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් එම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කරනු ලැබිය යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වනවිටත් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශයට අදාළ අනුමත කාර්ය මණ්ඩලය තුළ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 111/11 තනතුරක් අනුමතව ඇති අතර එම තනතුර පුරප්පාඩුව පවතී. මේ පිළිබඳව කිහිප වරක් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුවත් කර ඇත. 2021.10.14 වන දින ද අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියකු පත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් ලිපියක් යොමු කර ඇත. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාර සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සඳහාම අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් තමාට සහායදීම පිණිස විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කළයුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වනවිටත් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය සඳහා මේ වන විට අභ්‍යන්තර විගණකවරයකු නොමැති බැවින්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සහාය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර නොමැත. අභ්‍යන්තර විගණකවරයකු පත් කළ වහාම විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන බවත් දැනට කාර්තුමය වශයෙන් පැවැත්විය යුතු කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහය ලබා දෙන ලෙස ලිඛිතව දන්වා යවා ඇත. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 05 ක් ද්විතීය මට්ටමේ තනතුරු 11 ක් ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත. | කළමණාකාරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කළ කාර්ය මණ්ඩලය සේවා අවශ්‍යතාව සැළකිල්ලට ගෙන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |